**අපි වෙනුවෙන් අපි අරමුදල - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

අපි වෙනුවෙන් අපි අරමුදල 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රණජයපුර නිවාස ව්‍යාපෘතියේ නිවාස ලාභීන් 707 ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවියයුතු හිඟ වාරික මුදල රු. 29,070,660 ක් වූ අතර එයින් වසරකට වැඩි කාලයක් හිඟ හිට පැවති ණය වාරික ප්‍රමාණය රු. 17,326,401 ක් විය. මෙම හිඟ වාරික අයකර ගැනිම හා ඒ පිළිබඳ පසුවිපරම් ක්‍රියාමාර්ගය සතුටුදායක මට්ටමක නොපැවතුණි. | ඉදිරියේදී එම හිඟ වාරික කඩිනමින් අයකර ගැනීමට කටයුතු සිදු කර ඇත.<br>තවද, 2020 වර්ෂයේ පැමිණි කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සේවයේ නියුතු යුධ හමුදා නිළධාරීන්ගෙන් විසින් 2020 අප්‍රේල් සහ මැයි මාසවල වාරික මුදල් අයකර නොමැත. | ගිවිසුම ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත | අරමුදල විසින් තිරසර සංවර්ධන අරමුණු තීරණය කර තිබුණු නමුත් එම අරමුණු කරා ලගාවීමට අවශ්‍ය ඉලක්ක තීරණය කිරීම හා එම ඉලක්ක ලභාකර ගැනීමේ ප්‍රගතිය මැනීමේ දර්ශක පිළියෙල කිරීම සමාලෝචිත වර්ෂය තුලදීද සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව කටයුතු කල යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 877 (2) (ඇ) | එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි වන පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබද කාර්තුමය වාර්තාවක් සකස් කර කාර්තුව අවසන් වී දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද 2020 අවසන් කාර්තුව සදහා එම වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි 877 (2) (ඇ) ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ)මුදල් රෙගුලාසි 877 | මූල්‍ය ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් සකස්කර ඉදිරිපත් කර යුතු වුවද 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාන සිංහල භාෂාවෙන් පමණක් ඉදිරිපත් කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි 877 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**1.8 ආයෝජන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අරමුදලේ ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂය තුල පවත්වාගෙන ගොස් තිබුණු සාමාන්‍ය මාසික ශේෂය රු.1,618,991 ක් වූ අතර ඉතුරුම් ගිණුමක පවත්වාගෙන ගොස් තිබුණු සාමාන්‍ය මාසික ශේෂය රු. 36,410,626 විය. එම | අංක 7040000 දරණ ජංගම ගිණුමේ රු. මිලියන 2.00 ක මුදල් රදවා ගනු ලබයි. තවද, එම ගිණුමට ලැබෙන ආදායම් රු. මිලියන 2.00 කට වඩා වැඩිවන විට ස්වයංක්‍රීයව අරමුදල් කළමනාකරන ගිණුමට බැරවීමට | අරමුදලේ සැලසුම්කල කටයුතු සදහා අයවැය පුරෝකථනයන් සිදුකර ඒ අනුව වියදම් සදහා මුදල් අවශ්‍යතා හා |

| | | |
|---|---|---|
| අතිරික්ත ශේෂ ඵලදායී ආයෝජනයක යෙදවීමෙන් අරමුදල් තරකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු යොදා ඇත. අංක 73249610 දරණ අරමුදල් කළමනාකරන ගිණුමේ පූර්ණ හා අර්ධ නිවාස සහ පරිපාලන වියදම් පියවීම සඳහා ඇතැම් මාසයන්හි රු.මිලියන 36.4 ක ප්‍රමාණයට වඩා මුදලක් දැරීමට සිදු වේ. ඉහත සඳහන් කල හේතූන් මත අතිරික්ත ශේෂ ඵලදායි ආයෝජනයක යෙදවීමට නොහැකි විය. | ආයෝජන සැලැසුම් සකස්කල යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

--------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 49,050,324 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 169,350,051 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 120,299,727 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ව්‍යාපෘති සංවර්ධන වියදම රු.189,961,246 කින් අඩුවීම සහ ව්‍යාපෘති මෙහෙයුම් වියදම රු. 6,747,031 අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 ක්‍රියාකාරී සැලසුම අනුව සමාලෝචිත වර්ෂයේදී රණවිරු අර්ධ නිවාස 400 ක් සම්පූර්ණ කර ගැනීම සඳහා රු.750,000 ක් බැගින් හා රණවිරු පූර්ණ නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස 50 ක් ඉදිකර ගැනීමට රු.1,500,000 බැගින් ආධාර මුදල් ලබාදීමට සැලසුම් කර තිබුණ ද පිළිවෙලින් අර්ධ නිවාස 38 ක් හා පූර්ණ නිවාස 09 ක් සඳහා දෙවන වාරිකයද, කිසිදු නිවසක් වෙනුවෙන් අවසන් වාරිකයද ගෙවා නොතිබුණි. ඒ අනුව මූල්‍ය කාර්යසාධනය සියයට 61 ක මට්ටමක පැවතුණි. | අදහස් දක්වා නොමැත. | ලබාදී ඇති ප්‍රතිලාභ වලින් ඉදිකිරීම් කටයුතු නිමකරවීම සඳහා ප්‍රතිලාභීන් උනන්දු කල යුතු අතර අරමුදල විසින් මනා අධීක්ෂණය, සුපරීක්ෂණය සහ පසුවිපරම් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි 877 (2) (ඇ) විධිවිධාන පරිදි අරමුදල විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාන සමග කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පනතේ 16.2 වගන්තිය හා මුදල් රෙගුලාසි 877 (2) (ඇ) විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව අරමුදෙල් මූල්‍ය ප්‍රකාන සහ විගණකාධිපති වාර්තාව අරමුදල ආරම්භයේ සිට 2019 වර්ෂය දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පනතේ 11(6) වගන්තිය අනුව කටයුතු කල යුතුය. |

### 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල විගණනය සඳහා වූ අභ්‍යන්තර විගණන වැඩසටහන යටතේ ලැබීම් හා ගෙවීම්,අවසාන ගිණුම් පිළියෙල කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණන පරීක්ෂණය සිදුකිරීමට සැලැසුම්කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අරමුදලේ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායී බව ඇගයීම සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුය. |

**4.4 අයවැය පාලනය**

**------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | -------------------------------- | ----------------- |
| මුදල් රෙගුලාසි 877 (2) (ඇ) හි 7 ඡේදය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා අනුමත අයවැය සීමාවන් හා සත්‍ය සීමාවන් සැසඳීම්කර විචලනයන් සඳහා හේතු ද සමග අයවැය සැසඳුම් ලේඛනය ගිණුම් සමග ඉදිරිපත් කල යුතු වුවද වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි 877 (2) (ඇ) හි 7 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුය. |